# කුමාර් සංගක්කාර ඩීමෝ සමඟින් දිගු ඉනිමක් ගොඩනගයි.

ක්‍රිකට් ලොවේ දක්ෂ වමත් පිතිකරුවෙකු හා චමත්කාරජනක කඩුළු රකින්නෙකු වන කුමාර් සංගක්කාර, වගකීමකින් කටයුතු කරන කීර්තිමත් ව්‍යාපාර දැවැන්තයෙකු වන ඩීමෝ සමාගමෙහි වෙළෙඳ දූත මෙහෙවරෙහි කටයුතු සලසනු ඇත.

Mercedes-Benz,TATA,Chrysler හා Jeep වැනි වාහන අලෙවිය හා බෙදාහැරීම සම්බන්ධව ප්‍රසිද්ධියක් උසුලන ඩීමෝ සමාගමේ ක්‍රියාකාරකම් වාහන වලටම පමණක් සීමා නොවූවකි. වෛද්‍ය උපකරණ, කෘෂි උපකරණ, විදුලි සංදේශනය, බලශක්ති සම්ප්‍රේෂණය, භාණ්ඩ ගබඩාංගනය වැනි විවිධ ක්ෂේත්‍ර ගණනාවක් ඔවුන් විසින් මෙහෙයවයි.

මේ කුමන ක්ෂේත්‍රයක නියැලුනද ඩීමෝ හි සේවා සියල්ල සිදුවන්නේ පොදු ධර්මතාවයකට එකඟවය. එනම් සෑම සියලු දේ කෙරෙහි ඉතා සූක්ෂම අයුරින් අවධානය යොමු කොට ඉහළ තත්ත්ව ප්‍රමිතියකින් මෙහෙයුම් සිදු කරන්නට ඔවුන් නිරතුරුවම වග බලා ගනියි.

ඒ නිසයි ලොව සුප්‍රකට, අංක එකේ නිෂ්පාදන රැසක් සමඟින් ඒකාබද්ධව කටයුතු කිරීමට ඩීමෝ සමාගමට හැකිව තිබෙන්නේ. Mercedes-Benz, Siemens, Bosch, TATA, Chrysler, MTU, Komatsu, Michelin, Osram, Mahindra, MRF, Zeiss, Schaefer ආදී ලෙස ඩීමෝ හා අත්වැල් බැඳගත් සුපිරි වෙළෙඳ නාම සමහරකි.

කුමාර් සංගක්කාර ද ඔහුගේ ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් එවැනිම කැප කිරීමකින් ක්‍රීඩා කරයි. නිවැරදි තාක්ෂණය අනුගමනය කරමින් අසීමිත උත්සාහය තුළින් ඔහුද ඔහුගේ ක්ෂේත්‍රයේ ඉහළම හිනිපෙත්තේ වැජඹෙයි. ඔහු අසමසම පිතිකරුවෙකු, සැබෑ මිනිසෙකු, චින්තනධාරියෙකු වන්නේ ඒ නිසයි.

කවුරුත් දන්නා පරිදි ඔහුගේ පිති හරඹයට දෙස් දෙන සාක්ෂියකි ඔහුගේ නොමඳ උත්සාහය. "කුමාර් ඔහුගේ ක්‍රිකට් ක්‍රීඩාවට දක්වන නොමඳ සැලකිල්ල යම් සේද ඩීමෝ සමාගම ද සිය ව්‍යාපාර කටයුතු ඉෂ්ඨ සිද්ධ කරන්නේ එලෙසිනි" යැයි ඩීමෝ සමාගමේ සභාපති, ප්‍රධාන විධායක නිලධාරී, රන්ජිත් පණ්ඩිතගේ මහතා කියා සිටී. "අප දෙපළම අපගේ කාර්යය නියමෙට සිදු කරන්න වග බලා ගන්නවා. අවස්ථානුකූලව අපගේ කැපවීම සැමවිටම උපරිමයකි. 100%කි" යැයි කුමාර් සංගක්කාර හා ඩීමෝ සමාගම අතර ඇති සමානතාවය පැහැදිලි කරමින් පණ්ඩිතගේ මහතා තවදුරටත් කරුණු දැක්වීය.

පසුගිය දශක දෙක තුළ ඩීමෝ සමාගමේ පිරිවැටුම රු. මිලියන 900 සිට රු. බිලියන 13 දක්වා ඉහළ නංවා ඇත. එලෙසම කුමාර් සංගක්කාරද ඔහුගේ ලකුණු රැස්කිරීමේ සාමාන්‍යය 30 සිට 40 දක්වාත්, 40 සිට 50 දක්වාත්, 50 සිට ක්‍රම ක්‍රමයෙන් තවත් ඉහළ නංවමින් සිටී.

මෙයින් ගම්‍යවන්නේ නියමෙට වැඩක් සිදු කරන්නට නම් අසීමිත කැපවීම අනිවාර්ය බවයි. අන් කවරෙකුටත් වඩා කුමාර් සංගක්කාර මෙන්ම ඩීමෝ ද හොඳාකාරවම දන්නා සත්‍යයකි මෙය. එමඟින් නෙලා ගත හැකි ඵල ප්‍රයෝජන අති විශාල බවද ඔවුන් දෙපළම දනී.